# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.10 පැය 2115 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1735/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ටී - 56 ගිනි අවියක් එම පතරොම් සහ අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - කොල්ලුපිටිය පොලිස් ස්ථානය.**

2025.09.09 වන දින රාත්‍රී කාලයේ කොල්ලුපිටිය පොලිස් වසමේ ඇල්ෆඩ් පෙදෙස මාර්ගය අසලදී කොල්ලුපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් සැකකටයුතු පුද්ගලයින් දෙදෙනෙකු පරීක්ෂා කිරීමට යාමේදී එක් පුද්ගලයෙකු ඔහු සන්තකයේ තිබූ බෑගයක් අතහැර දමා පලාගොස් ඇති අතර අනෙක් සැකකරු නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

නිලධාරීන් විසින් පලා යන ලද සැකකරු එම ස්ථානයේ දමා ගිය බෑගය පරීක්ෂා කර එම බෑගයේ තිබූ **ටී - 56 වර්ගයේ ගිනි අවියක්, එම පතොරම් 30 ක් සහිත පතරොම් ගැබක්, තහනම් පිහියක් හා සැකකරු සන්තකයේ තිබූ ජංගම දුරකථන 03 ක්** පොලිස් භාරයට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුගෙන් අනාවරණය කර ගන්නා ලද තොරතුරු මත **පලාගිය සැකකරු සහ තවත් සැකකරුවන් තිදෙනෙකු** මාලිගාවත්ත බෝධිරාජරාම මාවත ප්‍රදේශයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 18 ක්, අපරාධ සඳහා යොද ගත් බවට සැකකරන යතුරුපැදියක් හා ජංගම දුරකථන 02 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 19, 25, 40 සහ 48 වයස්වල පසුවන කොළඹ 14, වැල්ලම්පිටිය, මාලිගාවත්ත හා දෙමටගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

විදේශ රටක සිටින සංවිධානාත්මක අපරාධකරුවකුගේ උපදෙස් මත මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අරමුණින් මෙම ටී- 56 ගිනි අවිය සැකකරුවන් විසින් රැගෙන පැමිණ ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

කොල්ලුපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**